**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශයන් සමාලෝචිත වර්ෂය තුළ ද ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් ඒකක 2 ක ශේෂයන් භාණ්ඩාගාර වගු 82 හි ආරම්භක ශේෂ සමඟ සැසඳීමේදී රු.241,616,032 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම ශේෂයන් පිළිබඳ භාණ්ඩාගාරය සමඟ සාකච්ඡාකොට ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර වගු 82 අනුව වර්ෂය තුළ මිලදී ගත් මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.16,053,453 ක් හා වර්ෂය තුළ අපහරණය කරන ලද එකතුව රු.73,629,876 ක් වූ මූල්‍ය නොවන වත්කම් ඒකාබද්ධ සිගාස් වාර්තාවේ ඇතුළත්වී නොතිබුණි. | -එම- | මූල්‍ය නොවන වත්කම් සම්බන්ධව වර්ෂය තුළ සිදුවන සියළු අත්පත් කර ගැනීම් හා අපහරණයන් පිළිබඳව නිසි පරිදි සිගාස් වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.4,383,929 ක් වූ වතුර බවුසරයෙහි වටිනාකම රු.1,500,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.2,883,229 ක් අඩුවෙන් දැක්වීම, වාහනයක වටිනාකම වූ රු.6,600,000 ක් නොදැක්වීම හා පස්ගොඩ හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 හි ඉඩම් ප්‍රමාණය හා වටිනාකම තක්සේරු කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේ තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට හා තක්සේරු වාර්තා ලබාගෙන ඇතුළත් කිරීමට කටයුතු කිරීම. | නිවැරදිව මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවට තොරතුරු ඇතුළත් කළ යුතුය. |

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යායුතු නිල නිවාස පිළිබඳ පොරොත්තු ලේඛනය හා වාහන ලොග් පොත් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය. | මෙම ලේඛන නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මෙම ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතුය. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව බැඳීම්, බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි CIGAS ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් බැඳීම් හා බැරකම් සම්බන්ධ තොරතුරු CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගතයුතු බව දක්වා තිබුණි. ඒ අනුව විගණනය වෙත ඉදිරිපත් වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු.561,152 ක් වූ බැරකම් සම්බන්ධයෙන් වූ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද CIGAS පරිගණක වාර්තාව විගණනයට ඉදිරිපත් නොවීය. | CIGAS මෘදුකාංග පද්ධතියේ පවතින තාක්ෂණික දෝෂ හේතුකොටගෙන මෙම ගැටළු මතුවී ඇති බැවින් ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | ඉහත චක්‍රලේඛයේ 04 ඡේදය අනුව යම්කිසි නිශ්චිත දිනකට එක් එක් වියදම් ශීර්ෂ සඳහා වූ බැඳීම් හා බැරකම් ප්‍රමාණය හඳුනා ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වෙන්වූ තොරතුරු පද්ධතියක් නඩත්තු කරන බැවින් එම | CIGAS මෘදුකාංග පද්ධතියේ පවතින තාක්ෂණික දෝෂ හේතුකොටගෙන මෙම ගැටළු මතුවී ඇති බැවින් ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක් විසින්ම දිනපතා තම බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පවත්වා ගෙන යන වෙබ් අඩවියට උත්පනය (Upload) කළයුතු බව දක්වා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එසේ කටයුතු කරන බවට අදාල වූ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | | |
| (iii) | 2017 දෙසැම්බර් 22 දිනැති අංක 263/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව වාර්ෂික අයවැය ප්‍රතිපාදන කාර්තුමය පදනමින් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාලව 2018 වර්ෂයේ සිට බැදීම්, බැරකම් හා වියදම කාර්තුමය පදනමින් ගිණුම්ගත කළ හැකි වන සේ CIGAS වැඩසටහන හඳුන්වාදී ඇති බව දක්වා ඇත. ඒ අනුව පිළියෙල කරන ලද කාර්තුමය බැදීම්, බැරකම් පිළිබඳ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවුණි. | CIGAS මෘදුකාංග පද්ධතිය සෘජුවම අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සැලසුම් කළ පරිදි එම කටයුතු සිදු නොවූ බව දන්වා තිබුණි. | මෙම වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | අනාරක්ෂිතව හා භාවිතයෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ ගාල්කර තිබූ ට්‍රැක්ටර් රථය පිළිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. | මේ වනවිට මෙය මාතර දිස්ත්‍රික් ලේකම් නමින් පවරා ගැනීමට අදාළ තොරතුරු සොයා බලන බවත්, පවරා ගැනීමේ කටයුතු අවසන් කළ පසු වාහන ලේඛනයට ඇතුළත් කරන බවත් දන්වා තිබුණි. | මේ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුකොට ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමටත් තොරතුරු නිසි පරිදි ආයතනය තුළ පවත්වාගෙන යාමටත් කටයුතු කළ යුතුය. |

(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| (i) | තුවක්කු ආඥා පනත | රු. | | | |
| | අංක 22(2)(උ) වගන්තිය | - | ගිනිඅවි බලපත්‍රයක වලංගුභාවය අහෝසි වී සන්තකයේ තබාගත හැකි කාලසීමාව දින 10 ක් වන අතර බලපත්‍ර රහිතව දින 10 කට වැඩි කාලයක් එම ගිනි අවි සන්තකයේ තබාගැනීම අදාළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වුවත් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 10 දින වනවිට මාතර දිස්ත්‍රික්කයේ ගිනි අවි හිමිකරුවන් 14 දෙනෙකු සතු ගිනි අවි සඳහා වසර 01 සිට 05 ක කාල පරාසයක් තුළ බලපත්‍ර අළුත් කර නොතිබුණු අතර එම බලපත්‍ර රහිත ගිනිඅවි නැවත භාරදීමට කටයුතු | මේ පිළිබඳව කොට්ඨාශ භාර පොලිස් අධිකාරී ලිඛිතව දැනුවත් කර ඇති බවත් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් ද පොලිස් මූලස්ථානය දැනුවත් කර ලිපි යොමුකර ඇති බවත් දන්වා ඇත. | මෙලෙස බලපත්‍ර අළුත් නොකරන ලද ගිනි අවි සම්බන්ධව බලධාරීන් දැනුවත් කොට කඩිනමින් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කර නොතිබුණ ද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය ---------------------- xxiv පරිච්ඡේදයේ 4.4 ඡේදය හා 4.5 ඡේදය | 87,852 | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් ද, කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය හැරගිය නිලධාරියෙකුගෙන් ද අයවිය යුතු ණය ශේෂයන් අයකරගෙන නොතිබුණ අතර එම ණය ශේෂයන් වර්ෂ 05 කට අධික කාලයක් නිරවුල් නොවී පැවතුණි. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නීතිපති උපදෙස් අනුව මෙම ණය ශේෂ කපා හැරීමට තීරණය කර ඇති බවත් ඒ අනුව අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත් දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ අදාළ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි ---------------------- | | | විගණනය විසින් පෙන්වාදීමෙන් අනතුරුව ඉදිරියේදී මෙලෙස ගෙවීම් සිදු නොකරන ලෙස උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | • මුදල් රෙගුලාසි 136, 137, 138 හා 215(1) | 668 ,424 | ඇස්තමේන්තු කරන ලද වටිනාකම් දක්වමින් ගෙවීම් වවුචර් සකස් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් ගෙවා තිබීම හේතුවෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බැරකම් වටිනාකම නිසි පරිදි නිරූපණය නොවීය. | | |
| | • මුදල් රෙගුලාසි 1645(අ) | - | වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රයේ ආකාරයට වාහන ලොග් සටහන් පොතක් තබාගෙන, එය යාවත්කාලීනව පවත්වාගෙන යායුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 7 ක් සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව පරීක්ෂා කර බලා සටහන් වී නොමැති කරුණු සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------------<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළයුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 16 න් 15 කම එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | පැවති කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේදී එවැනි පරීක්ෂාවක් සිදුකිරීමට නොහැකි වූ බවත් දැනට පවතින ඉන්ධන ගැටළුකාරී තත්ත්වය යටතේ මෙවැන්නක් සිදු කිරීමට නොහැකි බවත් දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (v) | වෙනත් චක්‍රලේඛ<br>-------------------<br>• 2008 ඔක්තෝබර් 03 දිනැති අංක 9/2008 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය, 2010 මාර්තු 30 දිනැති අංක 9/2008 (සංශෝධන) චක්‍රලේඛය, 2018 ජූලි 17 දිනැති අංක 9/2008 (සංශෝධන II) චක්‍රලේඛය හා 2019 මැයි 09 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් | 2,748,197 | හමුදා සේවා හා දුබලතා විශ්‍රාම වැටුප් (59,6) ඒකාබද්ධ කර නොගෙවීම නිසා නියැදි පරීක්ෂාව අනුව මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක විශ්‍රාමිකයින් 19 දෙනෙකු වෙත 2014 ජුනි සිට 2021 දෙසැම්බර් දක්වා කාලයට අදාළව වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද දීමනා හා විශ්‍රාම වැටුප් ගණනය කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලෙස ප්‍රාදේශීය ලේකම් වරුන්ට දන්වා ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමටත් මෙම අඩුපාඩුව නිවැරදි කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ලිපි අංක 6/2019 | | | | |
| • 2011 මැයි 16 දිනැති අංක 04/2011 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 3 ඡේදය හා 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 3 ඡේදය | 342, 000 | විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා විට ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් අන්තර් දීමනාව ලබාදිය යුතු වුවද නියැදි පරීක්ෂාව අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක විශ්‍රාම වැටුප්ලාභීන් දෙදෙනෙකුට යැපීම් දීමනා (4) හා හමුදා සේවා වැන්දඹු විශ්‍රාම වැටුප (40) යටතේ අන්තර් දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමටත් මෙම අඩුපාඩුව නිවැරදි කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| • 2020 අගෝස්තු 26 දිනැති අංක 6/2020 දරන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 10.1 ඡේදය | - | නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම පැහැර හරින ගිනි අවි බලපත්‍රලාභීන් සම්බන්ධ තොරතුරු ගිනිඅවි ආඥා පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අදාළ කොට්ඨාශ භාර පොලිස් අධිකාරී වෙත යොමුකර ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කළයුතු වුවද විගණිත දිනය වූ 2022 පෙබරවාරි 10 දින දක්වාම | මේ සම්බන්ධව කොට්ඨාශ භාර පොලිස් අධිකාරී දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | මෙලෙස බලපත්‍ර අළුත් නොකරන ලද ගිනි අවි සම්බන්ධව බලධාරීන් දැනුවත් කොට කඩිනමින් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අදාළ තොරතුරු කොට්ඨාශ භාර පොලිස් අධිකාරීවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේ හෙයින් තුවක්කු ආඥා පනත යටතේ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට නොහැකි වී තිබුණි. | | |
| • 2018 සැප්තැම්බර් 26 දිනැති අංක MOD/CFS/12/FA/14 දරන ආරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ ලිපියේ 3 ඡේදය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාරගනු ලබන අබලන් හෝ පාවිච්චියට නුසුදුසු ගිනිඅවි, ආසන්න පොලිස් ස්ථාන වෙත යොමුකර ඒ මගින් සුදුසු කටයුතු කිරීම සඳහා පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වෙත යොමුකළ යුතු වුවද 2020 හා 2021 වර්ෂවල රජයට භාරගන්නා ලද ගිනිඅවි 10 ක් විනාශ කළයුතු බවට තක්සේරු මණ්ඩලය මගින් නිර්දේශ කර තිබියදී 2022 පෙබරවාරි 11 දින දක්වා මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දැනට ගබඩාවේ පවතින ගිනි අවි පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වෙත භාරදීමට ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබාගෙන ඇති බව දන්වා ඇත . | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා කරමින් මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ලබාගත යුතුය. |

(ඉ) අවිධිමත් ගනුදෙනු

---------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.3,835,015 ක වියදමක් දරා ස්ථාපිත කර තිබූ විදුලි සෝපානය 2022 අගෝස්තු මස වනවිටත් අක්‍රීය තත්ත්වයේ පැවති අතර මෙම ව්‍යාපෘතියට අදාළ රඳවුම් මුදල් ද නිදහස් කර තිබුණි. වර්තමානය වනවිට සේවා නියෝජිත ආයතනය තම වගකීම පැහැර හරින තත්ත්වයක් යටතේ මේ දක්වා මේ සඳහා දරා ඇති රු.4,608,657 ක වියදම ඵලදායී නොවන වියදමක් වී පැවතුණි. | මේ වනවිට අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇති බව දන්වා ඇත. | මෙම විදුලි සෝපානය යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ii) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මාතර කොටුව මහින්ද විජේසේකර ක්‍රීඩාංගනයෙහි 2021 දෙසැම්බර් වන විට විදුලි බිලෙහි රු.92,112 ක හා ජල බිලෙහි රු.24,823 ක හිඟයක් පැවති බව නිරීක්ෂණය විය. විදුලි බිලෙහි හා ජල බිලෙහි මෙපමණ හිඟ මුදලක් පැවතීමට හේතු පරීක්ෂා කර එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | භාවිතා නොකරන ලද කාලවකවානුව තුළ ජල බිල්පත එපමණ ප්‍රමාණයකින් වැඩිවීම සම්බන්ධව පැහැදිලි කිරීමක් ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලා ඇති බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෙම ක්‍රීඩාංගනය පවරා ගන්නා විටත් හිඟ විදුලි ගාස්තුවක් පැවති බවත් දන්වා තිබුණි. | හිඟ ජල බිල්පත් හා විදුලි බිල්පත් ඇතිවීමට හේතු සොයා බලා ඒවා කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා රු.8,138,542,000 ක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කර තිබුණු අතර රු.5,589,488,000 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණි. ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු.2,549,054,000 ක් අඩුවෙන් | මෙය ආයතනයේ පාලනයෙන් තොර බවත්, ප්‍රතිපාදන ඉල්ලුම් කළ ද භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් කිරීමේදී මෙවැනි තත්ත්වයක් ඇතිවී ඇති බවත් දන්වා තිබුණි. | අග්‍රිම ඉල්ලුම් කිරීමේදී අවශ්‍යතාවයන් හොඳින් හඳුනාගෙන ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමටත් ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව පරිහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

අග්‍රිම ලැබී තිබුණි. එය රු.54,596,000 ක හා රු.464,605,000 ක පරාසයක හෙවත් සියයට 13 හා සියයට 49 ක පරාසයක පැවතුණි.

**2.2 වියදම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------- | ------------ |
| (අ) | මූලධන වැය විෂයයන් 04 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 92 දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී තිබුණි. | කාර්යාල නිලධාරීන් බහුතරයක් නිවසේ සිට රාජකාරි කිරීමෙන් වැඩිපුර අන්තර් ජාලය ඔස්සේ රැස්වීම් පැවැත්වීම පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදී කරුණු හේතුවෙන් මෙසේ ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා තිබුණි. | අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමටත් ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 08 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 19 කින් සියයට 3 සිට සියයට 52 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර වියදම් දරා තිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ඉල්ලුම් කළ මුදල් අඩුකොට සංශෝධිත ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන්කිරීම නිසා මෙම තත්ත්වය උද්ගතවී පැවති බව දන්වා ඇත. | වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී හැකිතාක් දුරට ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 19 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 0.06 සිට සියයට 87 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කර තිබුණි. | වියදම් කළමනාකරණය කරගැනීම තුලින් ඉතිරිවීම් සිදුවූ බවත් ඉතිරි මුදල් අත්‍යවශ්‍ය වියදම් සඳහා මාරුකරන ලද බවත් දන්වා තිබුණි. | -එම- |
| (ඈ) | ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය යටතේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 23.68 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් රු.මිලියන 0.056 | ගිවිසුම අත්සන් කරන ලද කොන්ත්‍රාත්කරු ගිවිසුම කඩ කරමින් වැඩ අතරමඟ නතර කර දමා පැවතීම හේතුවෙන් මෙම තත්ත්වය උදාවූ බව දන්වා ඇත. | වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් පමණක් වියදම් කිරීම නිසා රු.මිලියන 23.624 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරිය ව්‍යාපෘතියට ලද ප්‍රතිපාදනයෙන් සියයට 99.7 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කර තිබූ ප්‍රගති වාර්තාව අනුව භෞතික ප්‍රගතිය සියයට 14 ක් ලෙස සඳහන් කර තිබුණි. | | |
| (ඉ) | මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය මගින් රු.මිලියන 29 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 0.793 ක් පමණක් වියදම් දරා තිබුණි. ඉන් රු.මිලියන 28.21 ක ඉතිරියක් නිරීක්ෂණය වූ අතර එය එම ව්‍යාපෘතියට ලද ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් වී තිබුණි. | කොරෝන තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීමත්, මිළ ඉහළ යෑම් හේතුකොට ගෙන ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවීමත්, කොන්ත්‍රාත්කරුවන් ලංසු ඉදිරිපත් කිරිමට මැලිවීමත් හේතුවෙන් ඉදිකිරීම් ඉටුකිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | වර්ෂය තුළ ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම හා පැරණි හා නව ගොඩනැගිලි සම්බන්ධ කිරීම සඳහා එකතුව රු.මිලියන 13 ක ප්‍රතිපාදන සහ තිහගොඩ, මාලිම්බඩ හා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදුලි සෝපාන සවිකිරීම සඳහා රු.මිලියන 15 ක ප්‍රතිපාදනයක් ලැබී තිබුණු අතර ඉන් කිසිදු වියදමක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු අතරමඟ වැඩ නතරකර දැමීම (අත්තිකාරම් මුදල් ලබා නොදීම ආදී හේතුන් මත) හේතුවෙන් මෙම ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට නොහැකි වූ බව දන්වා ඇත. | -එම- |
| (උ) | අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 20 ක ප්‍රතිපාදනයක් ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ ලැබී තිබුණු අතර වියදම් දරා තිබුණේ රු.මිලියන 0.449 ක් පමණි. රු.මිලියන 19.551 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එය එම ව්‍යාපෘතියට ලද ප්‍රතිපාදනයෙන් සියයට 98 ක් වී තිබුණි. | ප්‍රතිපාදන ලැබී තිබුණ ද මූලික කටයුතු ඉටුකිරීම සඳහා කාලයක් ගතවීම මත ඉදිකිරීම් කටයුතු නතර කිරීමට ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණය මත ඉදිකිරීම නතර කරන ලද බව දන්වා ඇත. | -එම- |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශ 29 කින් හා දෙපාර්තමේන්තු 21 කින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.3,580,885,348 ක් ද, හා රු.1,332,044,911 ක් ද ලෙස එකතුව රු.4,912,930,259 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.2,991,952,851 ක් හා රු.1,210,090,233 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.588,932,497 ක් හා රු.121,954,678 ක් ඉතිරිවී තිබූ අතර එහි ප්‍රතිශතය පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 9 ක් විය. | රේඛීය අමාත්‍යාංශ විසින් මෙම මුදල් වෙන්කරනු ලැබුවද මේ සඳහා අවශ්‍ය අක්මුදල් භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් පරිදි ලබා නොදීම නිසා මෙලෙස සිදුවූ බව දන්වා තිබුණි. | ලැබෙන ප්‍රතිපාදන හැකිතාක් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.69,576,920 ක් වූ වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු 290 කට අදාළ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් රු.8,110,371 ක් වූ තැන්පතු 22 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණි. | ප්‍රමාණවත් අක්මුදල් නොමැතිවීම, ව්‍යාපෘති සම්බන්ධ විගණන විමසුම් පැවතීම, ලිපිගොනුවල අඩුපාඩු සහිතවීම මත වවුචර් ඉදිරිපත් නොකිරීම වැනි හේතූන් මත මෙම තැන්පතු නිරවුල් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කරන ලද නමුත් 2022 මැයි 04 දින වන විටත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.3,444,830 ක් වටිනා චෙක්පත් 56 ක් පැවතුණි. | මෙම චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු අතර චෙක්පත් ලිවීමේදී මුදල් රෙගුලාසි 237 කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 ආරම්භ කර නොතිබුණු ව්‍යාපෘති

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞභාග්‍යා ගම්මාන 2021 වැඩසටහන යටතේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය රු.2,185,044 ක ප්‍රතිපාදන යටතේ කළුබෝවිටිය ගම්මානය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් 2021 දෙසැම්බර් මාසය වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | උපකරණ හිඟතාවය මත මෙම මිලදීගැනීම් ප්‍රමාද වුවද මේ වනවිට බෙදාදී ඇති බව දන්වා තිබුණි. | මෙම ප්‍රමාදයන් වළක්වා ගනිමින් ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමව උපයෝජනය කොට කඩිනමින් ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ සලසා දීමට ක්‍රියා කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ත්‍රිරෝද රථයක් අළුත්වැඩියාවකින් තොරව කාර්යාල භූමියේ නිෂ්කාර්යව ගාල්කර තිබූ අතර 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන දකුණු පළාත් පරිවාස දෙපාර්තමේන්තුවට පැවරීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් ක්‍රියා මාර්ග ගැනීම කළ යුතුය. |

**3.3 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල තව දුරටත් ක්‍රියා කිරීමට ඇති හානි පාඩු ලෙස දක්වා ඇති රු.181,867 ක හානි හා පාඩු ශේෂයක් වැරදිකරුවන්ගෙන් අයකර ගැනීම් හා පොත්වලින් කපාහැරීමට අනුමැතිය ලබා ගැනීම් යනාදිය සිදුකර ඇතත් 2022 අගෝස්තු 31 දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය සම්බන්ධව මෙතෙක් නඩු කටයුතු අවසන්වී නොමැති බවත් එම කටයුතු අවසන් වූ පසුව මෙම ශේෂය සම්බන්ධව කටයුතු කරන බවත් දන්වා තිබුණි. අනෙකුත් ශේෂයන් සම්බන්ධව ඉදිරියේදී පොත් වලින් කපාහැරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මේ සම්බන්ධව කටයුතු අවසන් කිරීමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |
| (ආ) | රු.47,550 ක හානි පාඩු ශේෂයක් සමාලෝචිත වර්ෂයේ හානි පාඩු ලේඛනයේ ඇතුළත් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණු අතර එම හානි පාඩු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | 2021 අවසන් ගිණුමට ඇතුළත් කිරීමට නොහැකි වූ මෙම හානි පාඩු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | සියළුම හානි පාඩු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළයුතු අතර කඩිනමින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හානි පාඩු සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ගොනු පරීක්ෂාවේදී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අදාලව 2019 හා 2021 වර්ෂවලදී සිදුවූ අලාභ හානි 2 ක් පැවති බව නිරීක්ෂණය විය. | ගොනුවල පවතින අඩුපාඩු නිවැරදි කර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට හා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හානි පාඩු සම්බන්ධව කඩිනමින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 2 කට විගණන දිනය වූ 2022 අගෝස්තු 31 දින වනවිටත් පිළිතුරු ලැබී නොතිබුණි. | මෙම විගණන විමසුම් සඳහා නිරීක්ෂණ මේ වනවිට කැඳවා ඇති බවත් ඒවා ලද පසු පිළිතුරු ඉදිරිපත් කරන බවත් දන්වා ඇත. | නියමිත කාල වකවානු තුළදී විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2019 වර්ෂයේ ක්‍රියාත්මක වූ ගම්පෙරලිය ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.471,679 ක් වැයකර සමගි මාවත 4 වන හරස් පාර ඉදිකර තිබූ නමුත් නිවැසියන්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකස් නොකිරීම නිසා ජලය බැසයාමේ ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් වර්ෂාව අවස්ථාවේදී වැසි ජලයෙන් මාර්ගය යටවන අතර මෙම ජලය බැස්සවීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් වගකිවයුතු ආයතන විසින් ලබාගෙන නොතිබුණි. | මෙම මාර්ගයෙහි පදිංචිකරුවෙකු විසින් විවිධ අවස්ථාවලදී අදාළ ආයතනය දැනුවත් කරමින් ලිපි ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | මේ තුළින් වැසි කාලයේදී නිවැසියන්ට සිදුවන අපහසුතාවයන් දුරු කිරීමට ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයන් කෙරෙහි අවධානය යොමු කොට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි දිවිනැගුම ව්‍යාපාරික සංගම් ශක්තිමත් කිරීම හා එම සංගම් තුලින් අලෙවි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ඉලෙක්ට්‍රොනික/පරිගණක තාක්ෂණ වේදය මගින් අලෙවි සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරිම සම්බන්ධීකරණය සඳහා පත්කර තිබූ නිලධාරියෙකු 2020 මාර්තු 02 දින සිට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි දකුණු පළාතේ සියළුම දිස්ත්‍රික්කවල අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා පත්කර තිබූ අතර ඔහුගේ සේවා ස්ථානය, ඔහුගේ ඉල්ලීම පරිදි මාතර දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය වී තිබුණි. මෙම නිලධාරියා හට | මෙම ඡේදයට අදාළ පිළිතුරු දිස්ත්‍රික් ලේකම්ගේ විෂය පථයට අයත් නොවන බව දන්වා තිබුණි. | මෙම නිලධාරියාගේ රාජකාරි කටයුතු විධිමත් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විධිමත් පත්වීමේ ලිපියක් හා නිශ්චිත රාජකාරි පැවරීමක් ද නොවූ අතර දකුණු පළාත වෙනුවෙන්ම රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර තිබුණද ඔහුගේ රාජකාරී මාතර දිස්ත්‍රික්කයට පමණක් සීමාවීම තුලින් මෙම සේවයට පත්කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | | |
| (ඇ) | දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.<br>------------------------------------------------ | | |
| (i) | කෝට්ටගොඩ උම්බලකඩ හා කරවල නිෂ්පාදන කර්මාන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අනුමත වී තිබූ රු.6,000,000 ක මුදලින් අදියර 2 ක් යටතේ මෙම ව්‍යාපෘතිය ඉටුකිරීමට 2021 දෙසැම්බර් 16 දින ග්‍රාම සංවර්ධන සමිති 2 ක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. 2022 පෙබරවාරි 23 දින විගණන භෞතික පරීක්ෂාව වනතෙක්ම ගොඩනැගිල්ලේ අත්තිවාරම දක්වා කොන්ක්‍රීට් කණු 24 ක් පමණක් ඉදිකර තිබූ අතර එම කණු සඳහා යෙදූ කම්බි මල කෑමට ලක්වී තිබූ බව නිරීක්ෂණය විය. විගණන අවස්ථාව වනවිටත් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා දින දීර්ඝ කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | රටේ පවතින අර්බුදකාරී තත්ත්වය මත වෙළඳපොල ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟයක් ඇතිවීම නිසාත්, කාලය ප්‍රමාණවත් නොවීම නිසාත් 2022 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස මෙතෙක් අනුමැතිය නොලැබීමත් මත ඉදිකිරීම් කටයුතු නතරවී ඇති බව දන්වා තිබුණි. | මෙම කටයුතු කඩිනමින් අවසන් කොට ජනතාවට ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කර දීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මැල්පුර සුසාන භූමියට යන පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රු.309,532 ක ඇස්තමේන්තුගත මුදලකට ඉටුකර දීම සඳහා ප්‍රජා සංවර්ධන සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මාර්ගය සම්බන්ධයෙන් සිදුකළ විගණන භෞතික පරීක්ෂාවට අනුව මීටර් 38 ක් දිග මාර්ගයෙහි ඇස්තමේන්තු වැඩ විෂය අංක 4 ප්‍රකාරව සෑම මීටර් 3 කටම ප්‍රසාරණ මූට්ටු (expansion joints) යෙදිය යුතු වුවත් මෙම මාර්ගය සඳහා යොදා තිබුණේ ප්‍රසාරණ මූට්ටු 3 ක් පමණි. ඇස්තමේන්තු ප්‍රකාරව කොන්ක්‍රීට් කුට්ටි පරීක්ෂාවක් සිදුකිරීම ද කර නොතිබුණු අතර ඇස්තමේන්තු ප්‍රකාරව මාර්ගයේ උස මිලි මීටර් 150 වියයුතු වුවත් මාර්ගය මැද පහත් වන ආකාරයට ඉදිකර තිබුණි. | ප්‍රසාරණ මූට්ටු 4 ක් සඳහා පමණක් බිල්පතෙහි මුදල් වෙන්කළ බවත් වර්ෂාව හේතුවෙන් මාර්ගයේ මතුපිට ආරක්ෂා කර ගැනිම සඳහා ඇතිරූ ඉටිකොල හේතුවෙන් මාර්ගයෙහි මතුපිට වෙනස්කම් සිදුවී ඇති බවත් දන්වා තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව මෙම කටයුතු ඉටුකර ගැනීමටත් එසේ නොවන විටදී ඒ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (iii) | ගොඩැල්ලවත්තේ සිට පෙත්තරේ පාරට වැටෙන කාණු පද්ධතිය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා රු.487,790 ක වටිනාකමක් යටතේ ප්‍රජා සංවර්ධන සමිතියක් සමඟ 2021 දෙසැම්බර් 15 දින ගිවිසුම්ගතවී තිබුණ ද 2021 දෙසැම්බර් 25 දිනට පෙර අවසන් කළයුතු වූ ව්‍යාපෘතිය 2022 පෙබරවාරි 24 දින විගණන භෞතික පරීක්ෂාව වනවිටත් අවසන් කර නොතිබුණි. අදාළ කාණුව ඉදිකිරීම සඳහා මාර්ගය මධ්‍යය කපා කම්බි පමණක් යොදා තිබූ අතර කම්බි මල බැඳීමට ලක්ව තිබුණු අතරම මාර්ගයේ ගමන් කරන්නන්ට ද මෙලෙස මාර්ගය මධ්‍යයේ කාණුව කපා තිබීම ගමනාගමනයට බාධාවක් බව නිරීක්ෂණය විය. | රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනීමට අපහසුවීම මත ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | මෙම කටයුතු කඩිනමින් අවසන් කොට ජනතාවට ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කර දීමට කටයුතු කළ යුතුය. |
| (iv) | මැටි කර්මාන්තය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.757,160 ක මුදලකට ඉටුකිරීමට ප්‍රජා සංවර්ධන සමිතියක් සමඟ ගිවිසුම්ගතවී තිබූ අතර 2021 දෙසැම්බර් 28 දිනට ව්‍යාපෘතිවල වැඩ අවසන් බවට කොන්ත්‍රාත්කරු ලිඛිතව දන්වා තිබුණ ද 2022 පෙබරවාරි 24 විගණන භෞතික පරීක්ෂාව වනවිටත් ඉටු නොකරන ලද කාර්යයන් පැවති බව නිරීක්ෂණය විය. මෙහි ඇස්තමේන්තු විෂය අංක G 1 ප්‍රකාරව සෙවිලි තහඩු සහ ආනයනික දැව සම්පූර්ණයෙන් යොදා වහල නිම කිරීමට රු.195,448 ක් ඇස්තමේන්තු කර තිබියදී නැවත වැඩ විෂය අංක G 2 ලෙස Wall Plate සඳහා රු.106,212 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම G 2 විෂය අංක ප්‍රකාරව 5 x 3 Wall Plate 04 ක් ඉදිකළ යුතු වුවද ඉදිකර තිබුණේ 2 ක් පමණි. ඇස්තමේන්තු විෂය අංක G 1 ප්‍රකාරව ආනයනික දැව සඳහා කළු හෝ දුඹුරු දැව ආරක්ෂක දෙවරක් ආලේප කර නොතිබුණි. | ඇස්තමේන්තු සැකසීමේදී සිදුවූ අතපසුවීම නිවැරදි කර නැවත ඇස්තමේන්තු සකස් කළ බවත් බිල්පත සඳහා ගෙවීම් කිරීමේදී වැඩිපුර සිදුකරන ලද මිනුම් අඩුකර ගෙවීම් කිරීමත් සිදුකරන බව දන්වා තිබුණි. | ඉටුනොකරන ලද වැඩ කඩිනමින් ඉටු කර ගැනීමටත් ඇස්තමේන්තු ප්‍රකාරව ඉටු නොකරන ලද වැඩ පිළිබඳව කොන්ත්‍රාත්තුව සඳහා මුදල් ගෙවීමේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | රජය විසින් ප්‍රදානය කරනු ලබන දීමනාපත්‍ර, ඉඩමක පවතින ඛණිජ සම්පත් සම්බන්ධයෙන් වන පැවරුම්කරයෙහි රක්ෂිත වගන්ති අනුව “ඉඩමෙහි හා එහි මතුපිට ඇති සියළු ඛණිජ ද්‍රව්‍ය පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හැරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යාමේ අයිතිය රජය වෙත | මේ පිළිබඳව ඉඩම් කොමසාරිස් කාර්යාලය මගින් උපදෙස් ඉල්ලා ඇති නමුත් මේ වන තෙක් ඒ සඳහා පිළිතුරු නොලද බවත් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ | එම වගන්තිය ප්‍රකාරව නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙන්කර තබාගනු ලැබේ" යනුවෙන් සඳහන් වුවද, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි රජයේ දීමනා පත්‍ර සහිත ඉඩම් කැබලි 5 ක කළුගල් කැණීම සඳහා පෞද්ගලික ඉල්ලුම්කරුවන් වෙත අවසර ලබාදී තිබුණි. රජය සතුව පවතින හිමිකම වෙනත් පුද්ගලයෙකු වෙත ලබාදෙන්නේ නම් ඉඩම් සම්බන්ධයෙන් රජයට යම් ගාස්තුවක් අයකර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කළයුතු වුවද එසේ කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වා ඇත. | |
| (ඉ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් නිකුත් කරන ලද කැනීම් බලපත්‍රයේ පනවා ඇති කොන්දේසි ප්‍රකාරව කැනීම් මුහුණතෙහි ඇති අස්ථාවර ගල්කුට්ටි හා කලින් සිදුකළ පිපිරවීම්වලදී ඇතිවූ ගල් නැවත පිපිරවීම් ආරම්භ කිරීමට ප්‍රථම ඉවත් කළයුතු බවටත්, කැනීම් තට්ටු ආකාරයෙන් එක් තට්ටුවක උස මීටර් 10 වන ලෙස ඉටුකළ යුතු බවටත්, කැනීම් සිදුකිරීමේදී ඉඩමේ සියළු මායිම් වටා මීටර් 5 ක බිම් තීරුවක් කැනීමෙන් තොරව අත්හළයුතු බවටත් කැනීම් භූමියෙහි මායිම් කොන්ක්‍රීට් කණු මගින් පැහැදිලිව සලකුණු කර කැනීම් අවසන් වනතුරු පවත්වාගෙන යායුතු බවටත්, කළුගල් ප්‍රවාහනයේදී එම ගල් හොඳින් ආවරණය කළයුතු බවටත් මදුරුවන් බෝවිය හැකි වතුර වලවල් ඇති නොවන පරිදි කැනීම් භූමිය පවත්වාගෙන යායුතු බවටත්, සේවකයින් සඳහා පුද්ගලික ආරක්ෂක උපකරණ ලබාදිය යුතු අතර සේවයේ යෙදී සිටීමේදී ඒවා පිළිපැදිය යුතු බවටත් කරුණු දක්වා තිබුණ ද මාතර, හක්මණ හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විගණන භෞතික පරීක්ෂාවට ලක්වූ ගල්වල හිමියන් විසින් එම කොන්දේසි නිසියාකාරව ඉටුකර නොතිබියදී දිගින් දිගටම කැනීම් බලපත්‍ර නිකුත් කර තිබුණි. | අදාළ ආයතන වෙතින් නිරීක්ෂණ ලද පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව දන්වා ඇත. | කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශයන් නිකුත් කිරීමේදී මේ පිළිබඳව නිසි අවධානය යොමුකොට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 368 B දොල මාවත ග්‍රාම නිලධාරී වසමේ එරනවිලහේන නැමැති රජයේ ඉඩමෙහි පවත්වාගෙන යනු ලබන ගල්කොරිය කිසිදු බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නොමැතිව මාස තුනකට ආසන්න කාලයක් පවත්වාගෙන ගොස් තිබුණද අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.<br>විගණන පරීක්ෂාවට ලක්වූ 2022 ජුනි මස වනවිට ද එම කළු ගල් කැනීමේ කටයුතු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් කාර්මික කැනීම් බලපත්‍රය ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ද දිස්ත්‍රික් පුපුරන ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කරන ලද පුපුරන ද්‍රව්‍ය අවසර පත්‍රය ද ලබාගෙන නොතිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වනවිට එම ස්ථානයෙහි කළු ගල් කැනීම් සිදු කර ඇති බවට නිරීක්ෂණය වූ අතර ගල් ඇඹරුම් යන්ත්‍රයක්, එක්ස්කැවේටර් යන්ත්‍ර 02 ක් හා කොම්ප්‍රෙෂර් යන්ත්‍රයක් ද පැවති බවත්, ගල් මෝල ද ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බවත් නිරීක්ෂණය විය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හා මධ්‍යම පරිසර අධිකාරියට මේ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු සිදුකළ හැකි බව දන්වා ඇත. | මේ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු කරවන අතර මේ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත්කොට නිසි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අස්මගොඩ හිරුවලහේන ඉඩමේ මුල් අයිතිකරු විසින් ගල් වැඩපලක් ආරම්භ කිරීමට 2005 වර්ෂයේදී ඉල්ලීම් කර තිබූ අතර මධ්‍යම පරිසර අධිකාරිය, සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක හා ප්‍රාදේශීය පරිසර නිලධාරී විසින් එම ගල් වල පවත්වාගෙන යාමට නුසුදුසු බව ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබුණි. 2017 වර්ෂයේදී නැවත ගල් වැඩපලක් ආරම්භ කිරීමට අවසර ඉල්ලා තිබූ අතර පෙර තිබූ හානිදායක තත්ත්වය නොසළකා 2018 වර්ෂයේ සිට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ගල් කැඩීම සඳහා කැනීම් බලපත්‍රය නිකුත් කර කැනීම් කටයුතු සිදුකර තිබුණි. 2005 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 06 දින වනවිටත් මධ්‍යම පරිසර අධිකාරියෙන් මේ සඳහා අවසරපත්‍ර නිකුත් කිරීමක් සිදුකර නොතිබුණු අතර හේනෙගම ගම්වාසීන් විසින් ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද පැමිණිල්ල අනුව 2020 දෙසැම්බර් 16 දින මධ්‍යම පරිසර අධිකාරී නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් විසින් | මේ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා මධ්‍යම පරිසර අධිකාරියෙන් නිරීක්ෂණ කැඳවා ඇති බව දන්වා ඇත. | මෙවැනි බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර අදාළ ආයතන විසින් නියම කර ඇති කොන්දේසි ඉටුකිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතු අතර මෙම ගල්වල පවත්වාගෙන යාම පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්නම් පමණක් ගල්වල සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලෙස දක්වා තිබුණු නමුත් එම නිර්දේශ ඉටු කර ඇති බව 2022 ජනවාරි 12 විගණිත දින වනවිටත් තහවුරු නොවුණි. | | |
| (ඉ) | සපිරිගමක් සංවර්ධන වැඩසටහන - 2020<br>------------------------------------------- | | |
| (i) | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාඹටුන්න දකුණ ග්‍රාම නිලධාරි වසමේ සමගි මාවත අතුරු පාර සංවර්ධනය කිරීම වෙනුවෙන් දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දෙවිනුවර ප්‍රාදේශීය සභාව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර, කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් 2021 ඔක්තෝබර් 21 දින වනවිටත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර භාර දී නොතිබුණි. දෙවිනුවර ප්‍රාදේශිය සභාව විසින් 2021 දෙසැම්බර් 16 දින ව්‍යාපෘතියේ වැඩ නිමකිරීම සම්බන්ධයෙන් රු.1,428,300 ක් වටිනා ගෙවීම් බිල්පතක් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් සීමා ලකුණු කර පාරවල් සහ පටු මාවත් පිළිබඳ සැලැස්මවල් පිළියෙල කිරීම හා නාම ලේඛනයක් ගැසට් මගින් පළකරනු ලැබිය යුතු අතර, 24(3) හා 24(4) වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමෙන් පසු ප්‍රාදේශීය සභාව සතු සියළුම පාරවල් හෝ පටු මාවත් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුළත් කළ යුතු වුවත්, එම විධිවිධානයන්ට අනුකූල නොවී පෞද්ගලික ඉඩමක් තුළ රජයේ අරමුදල් භාවිතා කර මාර්ග සංවර්ධන කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගිවිසුම්ගත වී තිබුණි. | මේ සඳහා අවශ්‍ය මිනින්දෝරු සැලසුම් සැකසීමට විශාල මුදලක් දැරීමට සිදුවන බැවින් මෙතෙක් එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව ප්‍රාදේශිය සභාව විසින් දන්වා ඇති බව දන්වා ඇත. | මාර්ග සංවර්ධන කටයුතු සිදුකිරීමේදී ප්‍රාදේශීය සභා පනතට අනුකූලව ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග සංවර්ධනය සිදුකරන බවට තහවුරු කර ගැනීමෙන් පසුව ගිවිසුම්ගත වීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) | ඒ අනුව ප්‍රාදේශීය සභාව විසින් පෞද්ගලික ඉඩම් තුළ පවතින මාර්ගයට සමාන්තර නොවන ලෙස සිදුකළ අනවසර ඉදිකිරීම් වෙනුවෙන් වැඩ විෂය අංක 1 සිට 12 දක්වා එකතුව රු.1,152,676 ක් වූ බිල්පත්‍ර ඉදිරිපත් කර ඇති බවත්, ඒ තුළින් රජයේ අරමුදල් අවිධිමත් හා නීත්‍යානුකූල නොවන | මේ පිළිබඳව අදහස් දක්වා නොතිබුණි. | මේ සම්බන්ධව නිසි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වියදම් දැරීමට අවස්ථාව සලසා ඇති බවත් නිරීක්ෂණය විය. | | |
| (iii) | ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 13 යටතේ කොන්ක්‍රීට් කුට්ටිගල් ඇල්ලීම වෙනුවෙන් රු.271,425 ක් වූ වියදම් බිල්පත් ඉදිරිපත් කර තිබුණු අතර, මාර්ගයේ අතුරා තිබුණු කුට්ටිගල් නියමිත ප්‍රමිතියෙන් තොර බවට, රසායනාගාර පරීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉටු නොකල වැඩ වෙනුවෙන් ගෙවීමට අවශ්‍ය බිල්පත්‍ර ප්‍රාදේශීය සභාව විසින් සකස් කර, ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය. | මෙම ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරු වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. | මේ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු අතර ගෙවීම් සිදු කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ යුතුය. |
| (එ) | 2021 වර්ෂයේදී ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය<br>-------------------------------------------- | | |
| (i) | මුලටියන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද රදාවෙල හොරමුල්ල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා ගොවි සංවිධානයක් සමඟ රු.1,914,323 ක් වූ දින රහිත ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරි විසින් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, මාතර ඇමතූ අංක LD/472 දරන හා 2020 ඔක්තෝබර් 19 දිනැති ලිපිය හා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/11/19/MA/251 දරන හා 2021 නොවැම්බර් 24 දිනැති ලිපිය ප්‍රකාරව අදාළ ඉඩම සංවර්ධනය කිරීමේදී අනුගමනය කළයුතු කොන්දේසි හා නිර්දේශයන්වලට අනුකූල නොවී ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා ඉඩම සංවර්ධනය කරමින් පවතුණි. | ක්‍රීඩාපිටිය සකස් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදී තිබූ බවත් පසු සංරක්ෂණ බැම්ම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් නිසා 2022 අයවැය යෝජනා යටතට මෙය යොමුකර ඇති බවත් දන්වා තිබුණි. | මේ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMRSSII/DD/07/RSO-2-1 දරන හා 2021 මාර්තු 05 දිනැති ලිපියේ ඇමුණුම 04 හි සඳහන් මාර්ගෝපදේශයන් අනුව බිම් සකස් කිරීම, පස්, බොරලු සහ පිඩැලි ප්‍රවාහන කටයුතු සඳහා පළාත් පාලන | පළාත් පාලන ආයතනයේ පවතින සම්පත්වල හිඟකම හේතුවෙන් මෙම තීරණය ගත් බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනයේ යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රම දායකත්වය යොදාගත යුතු අතර, ඒ සඳහා වැයවන ඉන්ධන සඳහා වියදම පමණක් ඇස්තමේන්තුවට ඇතුළත් කළයුතු බවට නියෝග කර තිබුණද, ඊට අනුකූල නොවී ව්‍යාපෘතියේ එම වැඩ ගොවි සංවිධානයකට පවරා ඔවුන් මඟින් වැඩ නිම කර ගැනීම වෙනුවෙන් රු.1,941,323 ගෙවීමට ඇස්තමේන්තු සකස් කර තිබුණි. | | |
| (iii) | මාර්ගෝපදේශයේ වගන්ති අංක 05 ප්‍රකාරව ක්‍රීඩා භූමියේ අත්‍යාවශ්‍යයෙන්ම කළයුතු සංවර්ධන කටයුතු සිදු කරනු ලබන ක්‍රීඩාවන්ට පොදුවේ භාවිතා කළහැකි පරිදි ක්‍රීඩාංගනය සංවර්ධනය කළයුතු බවට නියෝග කර තිබුණත්, ඊට අනුකූලව ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් සිදුකිරීමට අවශ්‍ය වැඩ විෂයයන් ඇතුළත් කර ඇස්තමේන්තු සකස් කර නොමැති බවත්, භූමියට පස් දමා ගොඩකිරීම පමණක් ව්‍යාපෘතියේ මූලික අරමුණ වී තිබුණු බවත් විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ස්ථානයේ අවශ්‍යතාවය අනුව පොදුවේ භාවිතා කළ හැකි පරිදි ක්‍රීඩාංගනය සංවර්ධනය කර ඇති බවත් මේ වනවිට මෙම ක්‍රීඩාංගනය ප්‍රදේශවාසීන් විසින් භාවිතා කරන බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතුය. |
| (iv) | ඒ අනුව අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 128(1) (ඒ) ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය. | අදාළ මාර්ගෝපදේශයන්ට අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බව දන්වා ඇත. | මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. |
| (ඒ) | පරපාමුල්ල නැගෙනහිර දූගහමලිත්ත ක්‍රීඩාංගනය වොලිබෝල් ක්‍රීඩාපිටියක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මුලටියන ප්‍රාදේශිය සභාව අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමකට අනුව සමාලෝචිත වර්ෂයේදී රු.1,321,516 ක් ගෙවා තිබුණි. මෙම ක්‍රීඩාපිටියේ පැති දෙකක් ආවරණය වන පරිදි ඉදිකළ දැල් ආවරණය මතුපිට භූමියේ සිට පොළව ඇතුළට මීටර් 1.65 ක් යටවී තිබුණු අතර අදාළ කානුව හේතුවෙන් හා ඇස්තමේන්තු ප්‍රකාරව වොලිබෝල් කණු ස්ථාපිත නොකිරීමෙන් ක්‍රීඩාපිටිය භාවිතයට ගත නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් | මේ වනවිට පස් ඉවත්කොට ක්‍රීඩාපිටිය මට්ටම් කර ක්‍රීඩා කළ හැකි තත්ත්වයට පත්කොට ඇති බවත්, ප්‍රදේශවාසීන් හා පාසල් සිසුන් මෙහි ක්‍රීඩා කරන බවත් දන්වා තිබුණි. පස සෝදා යෑම වළකා ගැනීම සඳහා ඉඩම් පරිහරණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ 2022 වර්ෂයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන සඳහා මෙම | මෙලෙස ප්‍රතිපාදන නිශ්කාර්යව වැය කිරීම සම්බන්ධව නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කළයුතු අතර ක්‍රීඩාපිටිය ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට කඩිනමින් පත්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වොලිබෝල් ක්‍රීඩාව සිදුකළ හැකි අයුරින් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට තව දුරටත් රු.900,000 ක් වැයවන බව දක්වමින් මුලටියන ප්‍රාදේශීය සභාව විසින් රු.1,250,000 ක් සභා අරමුදලින් දැරීමට 2021 ඔක්තෝබර් 21 දින සභා තීරණය ගෙන තිබීමෙන් ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවූ රු.1,321,516 ක් නිශ්කාර්ය වියදම් වී තිබුණු බවට නිරීක්ෂණය විය.<br>කෙසේ වුවද ක්‍රීඩාපිටිය සකස් කිරීමේදී කපා ඉවත් කරන ලද පස් ඝන මීටර් 6763 ක් අවිධිමත් ආකාරයට බැහැර කර ක්‍රීඩාපිටියේම මීටර් 40 ක් පමණ දුරක සිට ගොඩගසා තිබුණු අතර වර්ෂාව හේතුවෙන් නායයෑමට ලක්ව එම පස් සෝදා ගොස් තිබීම හේතුවෙන් අවට පිහිටි රජයේ හා පෞද්ගලික ඉඩම්වලට හානිදායක තත්ත්වයන් ඇති වී තිබුණි. | ක්‍රීඩාපිටියේ බැවුම සහිත ප්‍රදේශය තෝරාගෙන ඇති බව දන්වා තිබුණි. | |
| (ඔ) | වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ රු.52,123,045 ක ප්‍රතිපාදන යටතේ විදාතා සම්පත් මධ්‍යස්ථානවල ක්‍රියාත්මක ව්‍යාපෘති<br>------------------------------------------- | | |
| (i) | ව්‍යාපෘතියේ අරමුණ ව්‍යවසායකයින් බිහිකිරීම වුවද විදාතා සම්පත් මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය අනුව මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක ග්‍රාම නිලධාරී වසම් 430 න් ග්‍රාම නිලධාරී වසම් 90 ක එක් ව්‍යවසායකයෙකු හෝ බිහිවී නොතිබුණි. | මෙලෙස ප්‍රතිලාභීන් කිසිවෙකු ඉදිරිපත් නොවීම සඳහා විවිධ හේතූන් ඉදිරිපත් කර තිබුණි. | ව්‍යාපෘතියෙහි අරමුණු කරා ලඟාවීම කෙරෙහි කටයුතු කිරීමට හැකිතාක් උත්සාහ දැරිය යුතුය. |
| (ii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 625 ක් වූ අතර, ප්‍රතිලාභීන් 418 දෙනෙකු සඳහා යන්ත්‍ර උපකරණ මිලදීගෙන තිබුණද උපකරණ 255 ක ප්‍රමාණයක් 2021 දෙසැම්බර් 31 දින වන විටද බෙදා දී නොතිබුණි. | ඒ වනවිට වෙළඳපලේ එවැනි යන්ත්‍රෝපකරණවල හිඟතාවය මෙයට හේතුවී තිබූ බව දන්වා තිබුණි. | මෙම උපකරණ කඩිනමින් බෙදා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2021 පෙබරවාරි 25 දිනැති වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 3/2021 දරන චක්‍රලේඛය හා අංක SMRIP/DEV/VY/10/03/2021(පොදු) ලිපිය අනුව නව ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසාකයින් බිහිකිරීම අරමුණ වුවද ඊට අනුකූල නොවී මාතර විදාතා මධ්‍යස්ථානය විසින් තෝරාගත් ප්‍රතිලාභීන් 22 කුගෙන් 19 දෙනෙකු දැනට එම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ප්‍රතිලාභීන් විය. තවද ඉහත ලිපිය අනුව ඇඟලුම්, ආහාර නිෂ්පාදනය, බිම්මල් වගාව ආදී කර්මාන්තයේ නියුතු ප්‍රතිලාභීන් තෝරා නොගතයුතු වුවත් ඊට අනුකූල නොවී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ග්‍රාම නිලධාරී වසම් 14 ක එවැනි කර්මාන්ත සඳහා ප්‍රතිලාභීන් 14 දෙනෙකු තෝරාගෙන තිබුණි. | චක්‍රලේඛයේ එසේ සඳහන් වුවද ප්‍රතිලාභී ඉල්ලීම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සිදුකළ යුතුය. |
| (iv) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (අ) අනුව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් විසින් සළකා බලනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අරමුදල් ලැබෙන බවට සාමූහිකවත්, තනි තනිවත් වගකිවයුතු වුවත්, ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මාතර හා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 4,643,834 ක් වූ නොගෙවූ බිල්පත් 40 ක් විෂයභාර නිලධාරී භාරයේ තිබුණි. ඒ අතුරින් බිල්පත් 21 කට අදාළ රු.1,969,169 ක් වටිනා භාණ්ඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී තෝරාගත් ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සිදුකර තිබුණි. ඉතිරි බිල්පත් 19 සඳහා ඇණවුම් කරන ලද භාණ්ඩ විගණිත දිනය වූ 2022 මාර්තු 23 දින වන විටද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබී නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ප්‍රතිලාභීන් වෙත භාණ්ඩ කඩිනමින් ලබාදීමටත්, සැපයුම්කරුවන් වෙත කඩිනමින් මුදල් ගෙවීමටත් කටයුතු කළ යුතුය. |

**4.** **තිරසාර සංවර්ධනය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ලඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී ද නිසි අවධානය යොමුකර නොතිබුණි. වර්ෂය තුළ ලද ප්‍රතිපාදන මත පදනම්ව තිරසාර සංවර්ධන අරමුණු 6 ක් හඳුනාගෙන තිබුණු අතර තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 11 ක් කෙරෙහි කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි. | අරමුණු 17 ක් හඳුන්වාදී තිබුණද, රේඛීය අමාත්‍යාංශ මගින් ලබාදෙන ප්‍රතිපාදන මත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන බැවින් මෙම අරමුණු යම් යම් සීමාවන්ට ලක්වන බව දන්වා තිබුණි. | මේ පිළිබඳව අවධානය යොමුකොට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | හඳුනාගත් අරමුණු 06 සම්බන්ධයෙන් වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සන්ධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | -එම- | අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉලක්ක හඳුනා ගැනීමටත් ඒ අනුව ක්‍රියා කරමින් ප්‍රගතිය මැන බැලීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමේ ළඟාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත යොමු කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් මෙම කටයුතු අවසන් කළ යුතුය. |

## 5. යහපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයෙන් හඳුන්වාදී ඇති පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළයුතු වුවද මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වනවිට 2022 වර්ෂයට අදාල පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1733 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 1827 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 10 ක් පුරවා ගැනීමට හා 104 දෙනෙකුගෙන් යුත් අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති බව දන්වා තිබුණි. | කඩිනමින් මෙම පුරප්පාඩු පුරවා ගැනීමටත් අතිරික්තය නියමානුකූල කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ඉහත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම සැලැස්ම සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 4/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යාම්, සේවයෙන් පහකිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මියයාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්ය මණ්ඩල වෙනස්වීම් යාවත්කාලීන කර සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට මෙම වෙනස්වීම් වාර්තා කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |